# ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

කොළඹ විශ්වවිද්‍යාලයීය
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මගින් පළ කැරිණි

# ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

## පූර්විකාව

ශ්‍රී ලංකාවේ දේශිය සම්ප්‍රදායන් අනුව සහ එහි සමාජ, ආර්ථික සහ ශුහ සාධන ප්‍රතිපත්ති අනුව ළමයින් කෙරෙහි ප්‍රවේදිතාව, සැළකිල්ල, පෝෂණය කිරිම, වර්ධනය සහ ඔවුන්ගේ සංවර්ධනය පිළිගනු ලැබ ඇති හෙයින්:

ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතිය හෝ සමාජ ප්‍රභවය, දේපළ, උත්පත්තිය හෝ වෙනත් තත්ත්ව වැනි කවර හෝ වර්ගයක වෙනස් කොට දැක්වීමක් නොමැතිව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති සියලු අයිතිවාසිකම්වලට සහ නන්වැදැරුම් නිදහසට සැම අයකුටම හිමිකම ඇති බව එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ් වී ඇති හෙයින්:

ළමයින්ගේ සහ තරුණයන්ගේ ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික සහ සමාජ පූර්ණ වර්ධනය සහතික කරනු පිණිස සහ සූරාකෑමෙන් සහ වෙනස්කම් දැක්වීමෙන් ඔවුන් ආරක්‍ෂා කරනු පිණිස රජය විසින් ළමයින්ගේ සහ තරුණයන්ගේ යහපත විශේෂ සැළකිල්ලකින් ප්‍රවර්ධනය කළ යුතු බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශ කොට ඇති හෙයින්:

නිදහස සාක්‍ෂාත් කර ගැනිම සඳහා සමාජ ප්‍රගතිය සහ වඩා යහපත් ජිවන තත්ත්වයක් ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වන හෙයින්:

සමාජයේ මූලික කණ්ඩායම වශයෙන් හා එහි සියලු සාමාජිකයන්ගේ විශේෂයෙන්ම, ළමයින්ගේ වර්ධනය සහ යහපත සඳහා ස්වාභාවික පරිසරය වශයෙන් පවුල විසින් සමාජය ඇතුළත ස්වකිය වගකීම් සම්පූර්ණයෙන් භාරගනු ලැබීමට හැකියාව ඇති කරනු පිණිස අවශ්‍ය ආරක්‍ෂාව සහ සහාය සළසනු ලැබිය යුතු හෙයින්:

ළමයා කෙරෙහි විශේෂ රැකවරණය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව 1924 ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ජිනිවා ප්‍රකාශනයෙහි සහ 1959 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන් විසින් සම්මත කරනු ලැබූ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි, 1976 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි, (විශේෂයෙන්ම එහි 23 වන සහ 24 වන ව්‍යවස්ථාවල) 1976 ආර්ථික සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි, (විශේෂයෙන්ම එහි 10 වන ව්‍යවස්ථාවෙහි) සහ ළමයින්ගේ ශුභසාධනය පිළිබඳ ප්‍රවේදිතාවක් ඇත්තා වූ විශේෂිත අනුයෝජිතායතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථා හා අදාළ සාධනපත්‍රවල පිළිගනු ලැබ ඇත්තා වූ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ප්‍රකාශකොට ඇති හෙයින් :

තම ශාරීරික සහ මානසික නොමේරූ භාවය නිසා ළමයාගේ උත්පත්තියට පෙර සහ පසුව උචිත නෛතික ආරක්ෂාව ඇතුළුව, ඔහුට විශේෂ ආරක්ෂාවන් සහ රැකවරණය අවශ්‍ය බව ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති හෙයින්:

ළමයෙකුගේ ආරක්ෂාව සහ සංගතික වර්ධනය සඳහා ළමයකුගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස රජය විසින් සංස්කෘතික අගැයීම්වල වැදගත්කම පිළිගැනීම අත්‍යවශ්‍ය හෙයින්:

ළමයෙකු පුද්ගලයෙකු වශයෙන් පවුලක සහ පෝෂ්‍යදායි සමාජ පරිසරයක සමාජයේ වගකිව යුතු වැඩිහිටියකු වශයෙන් අවසානයේ දී සහභාගිවනු පිණිස සැළකිල්ල ඇතිව ඇති දැඩි වී වර්ධනය විය යුතු බව අත්‍යවශ්‍ය හෙයින්:

ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ බැඳීම් ශ්‍රී ලංකාව විසින් අනුමත කොට පිළිගෙන ඇති හෙයින් සහ එම නිසා මෙම අයිතිවාසිකම් පිළිගන්නා නීති සහ ප්‍රතිපත්ති සඳහා විධිවිධාන සැළසිය යුතු හෙයින්:

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පහත දැක්වෙන පරිදි, මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### 1 වන ව්‍යවස්ථාව

### ළමයෙකු යන්නෙහි අර්ථ කථනය

මේ ප්‍රඥප්තියෙහි කාර්යය සඳහා ළමයෙකු යන්නෙන් වයස අවුරුදු 18 ට අඩු සැම මනුෂ්‍යයකුම අදහස් වන්නේ ය.

### 2 වන ව්‍යවස්ථාව

### වෙනස්කොට නොදැක්වීම

රජය විසින් -

(අ) ළමයාගේ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුගේ වර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතිය, ගෝත්‍රය හෝ සමාජ ප්‍රභවය, දේපළ, අශක්නුතාව, උත්පත්තිය හෝ වෙනත් තත්ත්වයන් කුමක් වුව ද කවර හෝ ආකාරයෙන් වූ වෙනස් කොට දැක්වීමක් නොමැතිව එක් එක් ළමයා සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ දක්වා ඇති අයිතිවාසිකම් ගරු කිරීම සහ සහතික කිරීම;

(ආ) ළමයාගේ දෙමාපියන්ගේ, භාරකරුවන්ගේ හෝ පවුලේ සාමාජිකයන්ගේ තත්ත්වය කටයුතු ප්‍රකාශිත මත හෝ විශ්වාස සම්බන්ධයෙන් වූ පදනම මත සියලු ආකාරයෙන් වූ වෙනස් කොට දැක්වීම්වලට හෝ දඬුවම්වලට විරුද්ධව ළමයා ආරක්ෂිත බව සහතික කිරීමට සියලු උචිත පියවර ගැනීම කරනු ලැබිය යුතු ය.

### 3 වන ව්‍යවස්ථාව

### ළමයාගේ උපරිම යහපත

(1) රජය විසින් -

(අ) ළමයාගේ යහපත සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ ප්‍රවේසම ද එම ළමයාගේ දෙමාපියන්ගේ හෝ! භාරකරුගේ අයිතිවාසිකම් සහ යුතුකම්

ද සුරක්ෂිත කළ යුතු අතර, ඒ අරමුණ අත්කර ගැනීමට උචිත සියලු පියවර ගත යුතු ය;

(ආ) ළමයෙකුගේ ප්‍රවේසම සහ ආරක්ෂාව සඳහා වගකිව යුතු සියලු ආයතන සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් වූ අංශවල මූලික ප්‍රමිතිවලට අනුකූල වන බව සුරක්ෂිත කළ යුතු ය.

(2) කවර හෝ යම් සමාජ සුබසාධන ආයතනයක්, අධිකරණයක්, පරිපාලන අධිකාරියක් හෝ යම් ව්‍යවස්ථාදායක මණ්ඩලයක් විසින් කටයුතු කරනු ලැබුව ද ළමයෙකු සම්බන්ධයෙන් වූ යම් කාරණයක දි, නඩුවක දී හෝ කටයුත්තක දී ළමයාගේ උපරිම යහපත මූලික සැළකිල්ල විය යුතු ය.

## 4 වන ව්‍යවස්ථාව
## අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම

මේ ප්‍රඥප්තියෙන් පිළිගනු ලැබූ අයිතිවාසිකම් ක්‍රියාත්මත කිරීම සඳහා රජය විසින් සියලු උචිත ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය. ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් රජය විසින් ලබා ගත හැකි ස්වකීය සම්පත්වල උපරිම ප්‍රමාණය අනුව යම් ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී ජාත්‍යන්තර සහයෝගතාව ඉල්ලා සිටිය යුතු ය.

## 5 වන ව්‍යවස්ථාව
## දෙමාපියන්ගේ මග පෙන්වීම සහ ළමයාගේ දක්ෂතා විකාශනය

(1) ළමයාගේ දක්ෂතා විකාශනය වීමට අනුකූල යම් ආකාරයකින් මේ ප්‍රඥප්තියෙන් පිළිගනු ලැබූ ඔහුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා ළමයාට උචිත විධාන සහ මග පෙන්වීම සැළසීමට ළමයෙකුගේ දෙමාපියන්ගේ සහ භාරකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් රජය විසින් ගරු කළ යුතු ය.

(2) යම් ළමයෙකුගේ මනසෙහි යහපත් අධ්‍යාත්මයක් වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඒ ළමයා අයත් ආගම ධර්මය සහ පරිචයන් ළමයාට ඉගැන්වීමෙන් නිසි ආගමික පරිසරයක ළමයා ඇති දැඩි කිරීමට හැම ළමයෙකුගේ ම මව හෝ පියා හෝ භාරකරුවකු රජය විසින් බැඳීමකට යටත් කළ යුතු ය.

## 6 වන ව්‍යවස්ථාව

### ජීවිතයට, උත්ජීවනයට සහ වර්ධනයට ඇති අයිතිය

සෑම ළමයෙකුටම ජීවිතයට නෛසර්ගික අයිතිය ඇති බව රජය විසින් පිළිගත යුතු අතර ළමයාගේ උත්ජීවනයට සහ වර්ධනයට උපරිම හැකියාව සහතික කළ යුතු ය.

## 7 වන ව්‍යවස්ථාව

### නාමය සහ ජාතිය

(1) ළමයකුගේ උත්පත්තිය සිදු වූ වහාම ඔහු ලියාපදිංචි කළ යුතු අතර, උත්පත්තියෙන් නාමයකට අයිතිය ද ජාතියකට අයත් වීමේ අයිතිය ද හැකිතාක් දුරට තම දෙමාපියන් කවුරුන් දැයි දැන ගැනිමට සහ ඔවුන්ගේ සත්කාර ලබා ගැනිමට ද අයිතිය ඇත්තේ ය.

(2) ළමයෙකු රටක් නැත්තකු වශයෙන් සළකනු ලැබීමෙන් වළක්වනු පිණිස නිතියට අනුකූලව මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම රජය විසින් සහතික කරනු ලැබිය යුතු ය.

## 8 වන ව්‍යවස්ථාව

### අනන්‍යතාව ආරක්‍ෂා කර ගැනීම

(1) නිත්‍යානුකූල නොවන මැදිහත්වීමකින් තොරව නිතිය මගින් පිළිගනු ලැබූ පරිදි ජාතිය, නාමය සහ පවුල් සම්බන්ධතා ඇතුළු ව තම අනන්‍යතාව ආරක්‍ෂා කර ගැනිම සම්බන්ධයෙන් ළමයකු සතු අයිතියට ගරු කිරීමට රජය විසින් භාර ගත යුතු ය.

(2) තම අනන්‍යතාව සම්බන්ධයෙන් වූ මූලික අංග එකක් හෝ වැඩි ගණනක් ළමයකුට නීති විරෝධී ලෙස අහිමි කොට ඇත්තා වූ අවස්ථාවක, ඔහුගේ අනන්‍යතාව කඩිනමින් නැවත තහවුරු කරලීමේ අරමුණ ඇතිව උචිත සහාය සහ ආරක්ෂාව රජය විසින් සලසා දෙනු ලැබිය යුතු ය.

**9 වන ව්‍යවස්ථාව**

**දෙමාපියන්ගෙන් වෙන්වීමෙන් ආරක්ෂාව**

(1) දෙමාපියන්ගෙන් වෙන්කිරීම ළමයාගේ උපරිම යහපතට අවශ්‍ය බව අදාළ නීතියට සහ කාර්ය පටිපාටිවලට අනුකූල වන්නේ නම් මිස, දෙමාපියන්ගේ කැමැත්තට විරුද්ධව ළමයකු ඔවුන්ගෙන් වෙන් කරනු නොලැබිය යුතු බව රජය විසින් සුරක්ෂිත කළ යුතු ය. දෙමාපියන් විසින් ළමයකු අනිසි ලෙස යෙදවීම හෝ නොසලකා හැරීම සම්බන්ධයෙන් වූ අවස්ථාවක හෝ දෙමාපියන් වෙන් වෙන්ව වාසය කරන යම් විශේෂ අවස්ථාවක දී එලෙස තීරණය කිරීම අවශ්‍ය විය හැකි අතර, එවිට ළමයාගේ වාසස්ථානය පිළිබඳ තීරණයක් කළ යුතු ය.

(2) ළමයකු සම්බන්ධයෙන් වූ නඩු කටයුතුවල දී ඒ ළමයා පිළිබඳව සම්බන්ධතාවක් ඇති සියලු තැනැත්තන්ට එම නඩු කටයුතුවලට සහභාගිවීමට සහ ඔවුන්ගේ අදහස් දැන ගැනීමට අවස්ථාවක් සලස්වනු ලැබිය යුතු ය.

(3) ළමයාගේ උපරිම යහපතට පටහැනි වන අවස්ථාවක දී හැර, පෞද්ගලික ඥාති සම්බන්ධතා නොකඩවා පවත්වා ගෙන යාමට සහ මව්පිය දෙදෙනා සමග සම්බන්ධතා ඇති කර ගැනීමට මාපිය දෙදෙනාගෙන් එක් අයෙකුගෙන් හෝ දෙදෙනාගෙන්ම වෙන්ව සිටින ළමයෙකුගේ අයිතිය රජය විසින් ගරු කළ යුතු ය.

(4) රඳවා තැබීම, බන්ධනාගාරගත කිරීම, පිටුවාහල් කිරීම, රටින් නෙරපීම සඳහා රජය විසින් ආරම්භ කරනු ලැබූ යම් නඩුවක

ප්‍රතිඵලයක් වශයෙන් හෝ (ඒ තැනැත්තා රජයේ රක්ෂිත භාරයේ සිටින අතරතුර යම් හේතුවක් නිසා මරණය සිදුවීමෙන්), මව්පිය දෙදෙනාගේම හෝ එක් අයෙකුගේ මරණය සිදුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ මව්පිය දෙදෙනාගෙන්ම හෝ ඔවුන්ගෙන් එක් අයෙකුගෙන් ළමයෙකු වෙන් කර ඇති අවස්ථාවක හෝ ළමයාගේ මරණය සිදු වුවහොත් එම තොරතුරු හෙළි කිරීම ළමයාගේ යහපතට හානිකර විය හැකි නම් හැර, ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, ළමයාගේ දෙමාපියන්ට, ළමයාට නැතහොත්, උචිත වන්නේ නම්, පවුලේ වෙනත් සාමාජිකයකුට අවස්ථාවෝචිත පරිදි, එම දෙමව්පියන් හෝ ළමයා සිටින ස්ථානය පිළිබඳව තොරතුරු රජය විසින් සැපයිය යුතු ය. එවැනි ඉල්ලීමක් ප්‍රදානය කරනු ලබන විට, අවස්ථාවෝචිත පරිදි දෙමාපියන්ට හෝ ළමයාට අනිෂ්ට විපාක කිසිවක් එම ඉල්ලීමෙන් උරුම නොවන බවට රජය සහතික කළ යුතු ය.

## 10 වන ව්‍යවස්ථාව

## පවුල නැවත එක් කිරීම

(1) නැවත එක්වීමේ හෝ ළමයා දෙමව්පිය ඥාති සම්බන්ධතාව පවත්වාගෙන යාමේ කාර්යය සඳහා කවර හෝ යම්. වේලාවක රටට ඇතුළුවීමේ හෝ රටින් පිටවීමේ අයිතිය ළමයකුට සහ ඔහුගේ දෙමාපියන්ට ඇත්තේ ය.

(2) (1) වන ඡේදයේ සඳහන් කාර්යය කිසිවක් සඳහා ළමයකු විසින් හෝ ඔහුගේ දෙමාපියන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් රජය විසින් නියත වූ ද, කාරුණික වූ ද කඩිනම් වූ ද ආකාරයකින් කටයුතු කළ යුතු ය. එවැනි ඉල්ලීමකින් ඉල්ලුම්කරුට හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුට හෝ අනිෂ්ට විපාක කිසිවක් උරුම නොවන බවට රජය සහතික කළ යුතු ය.

(3) රටින් පිටව යාමේ අයිතිය ක්‍රියාත්මක කළ හැක්කේ රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත් මහජන

සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත් අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස නිසි පරිදි ආරක්ෂා කිරීම පිණිසත් මේ ප්‍රඥප්තියෙන් පිළිගත් වෙනත් අයිතිවාසිකම්වලට අනුකූලවීම පිණිසත් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්ව ය.

## 11 වන ව්‍යවස්ථාව

### අපහරණය කිරීමෙන් ආරක්ෂාව

දෙමාපියන්ගෙන් එක් අයකු විසින් හෝ තෘතිය පාර්ශ්වයක් විසින් හෝ ළමයකු අපහරණය කොට එම ළමයා එම මව/පියා විසින් හෝ එම තෘතිය පාර්ශ්වය විසින් හෝ රඳවා තබා ගැනීම වැළැක්වීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු ය.

මේ කාර්යය ඉටුකර ගැනීම සඳහා රජය විසින් ද්විපාක්ෂික හෝ බහුපාක්ෂික ගිවිසුම් ඇති කිරීම හෝ පවත්නා ගිවිසුම්වලට එකතු කිරීම් ඇති කිරීම හෝ කළ යුතු ය.

## 12 වන ව්‍යවස්ථාව

### අදහස් සඳහා ඇති අයිතිය

තමාගේම අදහස් ඇති කර ගැනීමට ශක්තිය ඇති ළමයෙකුට ළමයා කෙරෙහි බලපාන සියලු කාරණාවල දී එම අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කිරීමේ අයිතිය රජය විසින් සහතික කළ යුතු ය. ළමයාගේ වයස සහ පරිණතියට අනුකූලව ඒ ළමයාගේ අදහස්වලට නිසි බරක් දෙනු ලැබිය යුතු ය.

මේ කාර්යය සඳහා කෙළින්ම හෝ නීතියෙන් ස්ථාපිත කාර්යපටිපාටියට අනුකූල යම් ආකාරයක් අනුව නියෝජිතයකු මගින් හෝ ළමයා කෙරෙහි බලපාන යම් අධිකරණමය සහ පරිපාලන කටයුත්තක දී විශේෂයෙන්ම ළමයාට ඇහුන්කම් දෙනු ලැබීමට විධිවිධාන සැලැස්විය යුතු ය.

## 13 වන ව්‍යවස්ථාව

## ප්‍රකාශ කිරීමේ නිදහස

(1) ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධයෙන් අයිතිය ළමයෙකුට ඇත්තේ ය. තවද, වාචික වශයෙන් හෝ ලිඛිතව හෝ මුද්‍රිතව හෝ චිත්‍රවල ආකාරයෙන් නැතහොත් ළමයාගේ කැමැත්ත අනුව තෝරා ගනු ලැබූ වෙනත් යම් මාධ්‍යයක් මගින් දේශ සීමා කෙරෙහි සැළකිල්ලක් නොමැතිව, තොරතුරු සහ සියලු වර්ගවලට අයත් අදහස් සොයා බැලීමට, භාරගැනීමට සහ ලබා දීමට ඇති නිදහස මේ අයිතියෙහි ඇතුළත් වන්නේය.

(2) එම අයිතිය ක්‍රියාත්මක කිරීම -

(අ) අන්‍යයන්ගෙන් අයිතිවාසිකම්වලට හෝ කීර්තියට ගරු කිරීමට

හෝ

(ආ) රාජ්‍ය ආරක්ෂාව, රටේ යථා පැවැත්ම, තහවුරු කිරීමට, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට අවශ්‍ය සීමා කිරීම්වලට යටත් වන්නේ ය.

## 14 වන ව්‍යවස්ථාව

## සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස

(1) දෙමාපියන්ගේ උචිත මඟ පෙන්වීමට යටත්ව, සිතීමේ නිදහසට හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට ළමයාගේ අයිතිය රජය විසින් ගරු කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකුගේ ආගම හෝ විශ්වාස ය, ඇදහීමේ නිදහස නීතියෙන් නියමිත සීමා කිරීම්වලට සහ රාජ්‍ය ආරක්ෂාව, රටේ යථා පැවැත්ම තහවුරු කිරීමට, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට, හෝ මූලික අයිතිවාසිකම් සහ අන්‍යයන්ගේ නිදහස ආරක්ෂා කිරීමට අවශ්‍ය සීමා කිරීම්වලට පමණක් යටත් විය යුතු ය.

## 15 වන ව්‍යවස්ථාව

### ආශ්‍රය කිරීමේ නිදහස

(1) ආශ්‍රය කිරීමේ නිදහස සහ සාමකාමීව රැස්වීමේ නිදහස සම්බන්ධයෙන් ළමයාගේ අයිතිවාසිකම් රජය විසින් පිළිගත යුතු ය.

(2) නීතියට අනුකූලව පනවනු ලැබුවා වූ සීමා කිරීම් සහ රාජ්‍ය ආරක්ෂාව, රටේ යටා පැවැත්ම තහවුරු කිරීමට, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට හෝ මූලික අයිතිවාසිකම් සහ අන්‍යයන්ගේ නිදහස ආරක්ෂා කිරීමට ප්‍රජාතාන්ත්‍රික සමාජයට අවශ්‍ය සීමා කිරීම් හැර, මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සීමා කිරීම් කිසිවක් ඇති නොකළ යුතු ය.

## 16 වන ව්‍යවස්ථාව

### පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් ආරක්ෂාව

(1) තම පෞද්ගලිකත්වය, පවුල, නිවාසය හෝ ලිපි කටයුතු සම්බන්ධයෙන් අත්තනෝමතික හෝ නීත්‍යානුකූල නොවන මැදිහත්වීමකට හෝ තම ගෞරවය සහ කීර්තිය පිළිබඳ ව නීත්‍යානුකූල නොවන පහරදීම්වලට හෝ කිසිම ළමයකු යටත් නොකළ යුතු ය.

(2) එවැනි මැදිහත්වීම්වලට හෝ පහරදීම්වලට විරුද්ධව නීතියේ ආරක්ෂාව ලබා ගැනීමට සෑම ළමයෙකුටම අයිතිය ඇත්තේ ය.

## 17 වන ව්‍යවස්ථාව

### උචිත තොරතුරුවලට ප්‍රවේශය

ජනසන්නිවේදන මාධ්‍යයන් විසින් ඉටු කරනු ලබන වැදගත් කර්තව්‍යය රජය විසින් පිළිගනු ලැබිය යුතු අතර, විශේෂයෙන්ම ළමයාගේ සාමාජික, අධ්‍යාත්මික හා සදාචාරාත්මක යහපත සහ කායික සහ මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමෙහිලා අරමුණු කරගනු ලැබූ ජාතික සහ අන්තර්ජාතික විවිධ මූලාශ්‍ර තොරතුරුවලට හා ද්‍රව්‍යවලට ළමයාට ප්‍රවේශය ඇති බව සහතික කළ යුතු ය.

මේ කාර්ය සඳහා -

(අ) ජනසන්නිවේදන මාධ්‍යයන් විසින්, ළමයා වෙත තොරතුරු සහ ද්‍රව්‍ය, සමාජ සහ සංස්කෘතික ප්‍රතිලාභ ලබා දීමට;

(ආ) සංස්කෘතික, ජාතික සහ අන්තර්ජාතික විවිධ මූලාශ්‍රවලින් එම තොරතුරු සහ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහිලා, හුවමාරු කිරීමෙහිලා සහ ප්‍රචාරණය කිරීමෙහිලා අන්තර්ජාතික සහයෝගිතාව ඇති කිරීමට;

(ඇ) ළමයින්ගේ පොත් නිෂ්පාදනය සහ ප්‍රචාරණය කිරීමට;

(ඈ) සුළු ජන කොටසකට අයත් ළමයෙකුගේ භාෂාමය අවශ්‍යතා පිළිබඳ ව ජනසන්නිවේදන මාධ්‍යයන් විශේෂ සැළකිල්ලක් දැක්වීමට;

(ඉ) යම් ළමයෙකුගේ යහපතට හානිකරවන තොරතුරුවලින් සහ ද්‍රව්‍යවලින් ළමයාගේ ආරක්‍ෂාව සඳහා උචිත ක්‍රියාමාර්ග වර්ධනය කිරීමට;

රජය දිරි ගැන්විය යුතු ය.

## 18 වන ව්‍යවස්ථාව
## ජාතිකානුරාගය ප්‍රවර්ධනය කිරීම

ළමයින් තුළ ජාතිය කෙරෙහි අනුරාගයක් ඇති කොට වර්ධනය කිරීම සහ ඔවුන් ජාතිකානුරාගය ඇති පුරවැසියන් වශයෙන් වැඩීමට සැළැස්වීම සෑම දෙමාපියකුගේ හෝ භාරකරුවකුගේ සහ ළමයින් අධ්‍යාපනය ලබන සෑම අධ්‍යාපන ආයතනයක යුතුකම වන්නේ ය.

## 19 වන ව්‍යවස්ථාව
## දෙමාපියන්ගේ වගකීම

(1) රජයේ ආර්ථික ප්‍රතිපත්ති මගින් ආධාර සැළසීමෙන් ළමයෙකුගේ ආරක්‍ෂාව, රැකවරණය, භාරකාරත්වය, සහ වර්ධනය සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අයිතිය පිළිගැනීම රජය විසින් සහතික

කළ යුතු ය. ළමයකු නඩත්තු කිරීමේ, ඇතිදැඩි කිරීමේ සහ වර්ධනය කිරීමේ මූලික වගකීම දෙමාපියන්ට නැතහොත් භාරකරුවන්ට ඇත්තේ ය. ඔවුන්ගේ මූලික ප්‍රවේදිතාව වනුයේ ළමයාගේ උපරිම යහපත ය.

මේ ප්‍රඥප්තියේ දක්වා ඇති අයිතිවාසිකම් සහතික කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා ළමයකු ඇති දැඩි කිරීමේ වගකීම් ඉටු කිරීමෙහි ලා ඔහුගේ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට රජය විසින් උචිත සහාය සැළසිය යුතු අතර, ළමයින්ගේ ආරක්ෂාව සඳහා ආයතන, පහසුකම් සහ සේවාවන් වර්ධනය කිරීම සහතික කළ යුතු ය.

(2) වෙනත් කරුණු අතර, තමන්ට හිමිකම් ඇත්තා වූ ළමා ආරක්ෂක සේවාවලින් සහ පහසුකම්වලින්, වැඩ කරන දෙමව්පියන්ගේ දරුවන්ට ප්‍රතිලාභ ලැබීමේ අයිතිය සහතික කිරීමට රජය විසින් සියලු උචිත ක්‍රියාමාර්ග ගත යුතු ය.

## 20 වන ව්‍යවස්ථාව

## අනිසි ලෙස යෙදවීමෙන් සහ නොසැළකිලිමත් භාවයෙන් ආරක්ෂා කිරීම

(1) දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ ආරක්ෂාවේ සිටින අතරතුර ලිංගික වශයෙන් අනිසි ලෙස යෙදවීම ඇතුළුව සියලු ආකාරයෙන් වූ ශාරීරික හෝ මානසික සාහසික ක්‍රියාවලින්, පීඩාවලින් හෝ අනිසි ලෙස යෙදවීමෙන්, නොසළකා හැරීමෙන් හෝ නොසැළකිලිමත් ලෙස සැළකීමෙන්, අයථා ලෙස සැළකීමෙන් හෝ සූරාකෑමෙන් ළමයා ආරක්ෂා කිරීමට උචිත සියලු ව්‍යවස්ථාමය, පරිපාලනමය, සමාජමය සහ අධ්‍යාපනික ක්‍රියාමාර්ග රජය විසින් ගත යුතුය.

(2) (1) වන ඡේදයේ සඳහන් අරමුණු අත්කර ගැනීමේ කාර්යය පිණිස ශාරීරික හෝ මානසික ක්‍රියා අයථා ලෙස සැළකීම සහ සූරාකෑම වැළැක්වීම සඳහා සහ උපද්‍රවයට පාත්‍ර වූවන්ට ප්‍රතිකාර කිරීම සඳහා රජය විසින් උචිත සමාජමය වැඩසටහන් සංවිධානය කළ යුතු ය.

## 21 වන ව්‍යවස්ථාව

## පවුලෙන් වෙන්වූ ළමයාගේ ආරක්ෂාව

(1) ළමයාගේ යහපතට හානිකර හේතු නිසා තම පවුලේ පරිසරය තාවකාලික ලෙස හෝ ස්ථිර වශයෙන් හෝ අහිමි කරනු ලැබූවා වූ නැතහොත් පරිසරයෙහි රැඳී සිටීමට ඉඩදෙනු ලැබිය නොහැකි වූ ළමයෙකුට රජය විසින් සලසනු ලබන විශේෂ ආරක්ෂාව සහ සහාය ලැබීමට හිමිකම ඇත්තේ ය.

(2) එවැනි ළමයකු වෙනුවෙන් රජය විසින් අවශ්‍ය අවස්ථාවක දී විකල්ප ආරක්ෂාව සහතික කළ යුතු අතර, වෙනත් කරුණු අතර, ඒ ළමයාගේ ගෝත්‍රික, ආගමික, සංස්කෘතික සහ භාෂාමය පසුබිම අනුව ඔහු ඇති දැඩි කිරීමේ යෝග්‍යතාව කෙරෙහි සැළකිල්ල ඇති ව පෝෂණයෙහි තැබීම, දරු කමට හදා ගැනීම හෝ ඒ ළමයාගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වන්නේ නම් සුදුසු ආයතනවල තැබීම ඊට ඇතුළත් විය යුතු ය.

## 22 වන ව්‍යවස්ථාව

## දරු කමට හදා ගැනීම

(1) දරු කමට හදා ගැනීම ප්‍රදානය කිරීමේ දී ළමයාගේ උපරිම යහපත පරම සැළකිල්ල විය යුතු බවට රජය විසින් සහතික කළ යුතු ය.

(2) අදාළ නීතිය හා කාර්යපටිපාටියට අනුව ළමයාගේ දෙමව්පියන්ට, ඥාතීන්ට සහ භාරකරුවන්ට අදාළව ඔහුගේ/ඇයගේ තත්ත්වය සම්බන්ධයෙන් නිශ්චිත කරගනු ලැබූ සියළු තොරතුරුවල පදනම මත පමණක් ළමයෙකු දරු කමට හදා ගැනීමට බලය දෙනු ලබන බව රජය විසින් සහතික කළ යුතු ය. තවද අවශ්‍ය අවස්ථාවල දී දරුකමට හදා ගැනීම සඳහා දෙමව්පියන්ගේ හෝ භාරකරුවන්ගේ කැමැත්ත ලබා ගත යුතු ය.

(3) රජය විසින් -

(අ) විදේශිකයන් විසින් දරුකමට හදා ගැනීම පිළිගත යුතු ය. තවද, ළමයා පෝෂක හෝ දරුකමට හදාගන්නා පවුලක් වෙත තබනු ලැබිය නොහැකි නම් නැතහොත් ළමයාගේ මව් රටේ හි සුදුසු යම් ආකාරයකින් රැක බලා ගත නොහැකි නම්, ළමයා රැක බලා ගැනීමේ විකල්ප ක්‍රමයක් වශයෙන් එලෙස දරුකමට හදා ගැනීම සලකනු ලැබිය හැකි ය;

(ආ) විදේශිකයන් විසින් දරුකමට හදා ගැනීමට ප්‍රදානය කරනු ලැබූ ළමයෙකු මෙරට දරුකමට හදා ගැනීමක් සම්බන්ධයෙන් පවත්නා ආරක්ෂාවන්ට සහ ප්‍රමිතිවලට සමාන ආරක්ෂාවන් සහ ප්‍රමිති භුක්ති විඳින බව සහතික කළ යුතුය;

(ඇ) විදේශීය දරුකමට හදා ගැනීමක දී ඒ දරුකමට හදා ගැනීමේ පාර්ශ්වයන් වන තැනැත්තන් විසින් අනිසි ලෙස මුදලින් ලාභ නොලබන බව සහතික කිරීමට උචිත සියලු පියවර ගත යුතු ය;

(4) දරුකමට හදා ගැනීම සඳහා යම් ළමයෙකු දීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් ගර්භණී ස්ත්‍රියක් නඩත්තු නොකරන බව හෝ තබා නොගන්නා බව රජය විසින් සහතික කළ යුතු ය.

## 23 වන ව්‍යවස්ථාව

## සරණාගත ළමයින්

(1) සරණාගත තත්ත්වය අපේක්ෂා කරන්නා වූ හෝ අදාළ නීතියට සහ කාර්ය පටිපාටිවලට අනුකූලව සරණාගතයකු ලෙස සලකනු ලබන්නා වූ ළමයකු, තම දෙමාපියන් හෝ වෙනත් යම් තැනැත්තෙකු කැටුව නොපැමිණිය ද එලෙස පැමිණීම ද ඔහුට මේ ප්‍රඥප්තියේ සහ රජය පාර්ශ්වයක් වන්නා වූ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් හෝ මානව හිතවාදය පිළිබඳ සාධන පත්‍රවල දක්වා ඇති අදාළ අයිතිවාසිකම් භුක්ති

විඳීමේ දී උචිත ආරක්‍ෂාව සහ මානව හිතවාදි සහාය ලැබෙන බව සහතික කිරීමට රජය විසින් උචිත ක්‍රියාමාර්ග ගත යුතු ය.

(2) මේ කාර්යය අත්කර ගැනීම සඳහා ඒ ළමයාගේ දෙමාපියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයන් සොයා ගැනීමට සහ ඔහුගේ පවුල නැවත එක් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට වෙනත් රටවල සහායෝගය ඇතිව රජය විසින් ඒ ළමයාට ආරක්‍ෂාව සහ සහාය සැළසිය යුතු ය. දෙමාපියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයන් සොයා ගනු ලැබිය නොහැකි අවස්ථාවල දී මේ ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි යම් හේතුවක් නිසා තම පවුල් පරිසරය ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ අහිමි වූ වෙනත් යම් ළමයෙකුට මෙන් එම ළමයාට ද ආරක්‍ෂාව සැළසිය යුතු ය.

## 24 වන ව්‍යවස්ථාව

## අබලතාවට පත් ළමයින්

(1) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් හෝ අබලතාවට පත් ළමයෙකු පූර්ණ සහ යහපත් ජීවිතයක් භුක්ති විඳින බව රජය විසින් සහතික කළ යුතු ය. තවද, ගෞරවය සහතික කළ යුතු අතර, ආත්ම විශ්වාසය ප්‍රවර්ධනය කොට ජන සමාජයෙහි ඒ ළමයාගේ ක්‍රියාශීලි සහභාගිත්වය සඳහා පහසුකම් සැලසිය යුතු ය.

(2) අබලතාවට පත් ළමයෙකුගේ විශේෂ රැකවරණයට ඇති අයිතිය රජය විසින් පිළිගත යුතු ය. තවද, එවැනි ළමයෙකුට සහාය දීම දිරිගැන්විය යුතු අතර එය සහතික කළ යුතු ය.

(3) දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ මූල්‍ය සම්පත් සැළකිල්ලට ගෙන, හැකි කවර හෝ විටෙක එවැනි ළමයෙකුට රජය විසින් සහාය සැළසිය යුතු ය. තවද අබලතාවට පත් ළමයාගේ සංස්කෘතික සහ අධ්‍යාත්මික වර්ධනය ඇතුළු ව හැකි පූර්ණ සමාජ ඒකග්‍රතාව සහ පෞද්ගලික වර්ධනය ඒ ළමයා විසින් අත්කර ගනු ලැබීමට හිතකර

ආකාරයකින් අධ්‍යාපනය, පුහුණුව, සෞඛ්‍ය ආරක්‍ෂක සේවා, පුනරුත්ථාපන සේවා, සේවා නියුක්තිය සඳහා සූදානම් කිරීම සහ විනෝදාස්වාදය ලැබීමේ අවස්ථා සඳහා ඵලදායි ලෙස ප්‍රවේශය සහ ඒවා ලබන බව සහතික කළ යුතු ය.

(4) පුනරුත්ථාපන, අධ්‍යාපන සහ වෘත්තිය ක්‍ෂේත්‍රයෙහි නිරත තැනැත්තන්ගේ හැකියාවන් සහ දක්‍ෂතා වැඩි දියුණු කිරීමට සහ එම ක්‍ෂේත්‍රයෙහි ඔවුන්ගේ පළපුරුද්ද පුළුල් කිරීමට රජයට හැකියාව ඇති කිරීමේ අරමුණ ඇතිව, පුනරුත්ථාපනය, අධ්‍යාපනය සහ වෘත්තිය සේවා සම්බන්ධයෙන් ක්‍රම පිළිබඳ තොරතුරු බෙදා හැරීම ඇතුළුව නිවාරණ සෞඛ්‍යය හා වෛද්‍ය, මනෝ චිකිත්සක හා අබලතාවට පත් ළමයින්ට කෘත්‍යමය ප්‍රතිකාර කිරීමේ ක්‍ෂේත්‍රයෙහි උචිත තොරතුරු හුවමාරු කර ගැනීම වෙනත් රටවල සහාය ඇතිව රජය විසින් ප්‍රවර්ධනය කළ යුතු ය.

## 25 වන ව්‍යවස්ථාව

### සෞඛ්‍යය සහ සෞඛ්‍ය සේවා

(1) අසනීපවලට ප්‍රතිකාර ගැනීම සඳහා සෞඛ්‍ය සහ වෙනත් පහසුකම් සම්බන්ධයෙන් අත්කර ගත හැකි උසස්තම ප්‍රමිති භුක්තිවිඳීමට ළමයා සතු අයිතිය රජය විසින් පිළිගත යුතු අතර, එවැනි සෞඛ්‍ය ආරක්‍ෂා සේවාවලට ප්‍රවේශය ලැබීමේ තම අයිතිය කිසිම ළමයෙකුට අහිමි කරනු නොලබන බව සහතික කළ යුතු ය.

(2) මේ අයිතිය ක්‍රියාත්මක කිරීමට රජය විසින් කටයුතු කළ යුතු අතර, විශේෂයෙන්

(අ) ළදරු සහ ළමා මරණ අඩු කිරීම;

(ආ) මූලික සෞඛ්‍ය ආරක්‍ෂාව වර්ධනය කිරීම පිළිබඳ ව අවධාරණය ඇතිව, සියලු ළමයින්ට අවශ්‍ය වෛද්‍ය සහාය සහ සෞඛ්‍ය ආරක්‍ෂාව සැළසීම සහතික කිරීම;

(ඈ) පහසුවෙන් ලබාගත හැකි තාක්ෂණය යෙදවීමෙන් සහ පාරිසරික දූෂණයෙන් සිදුවන අනතුරු සහ අවදානම් සැළකිල්ලට ගෙන, පෝෂ්‍යදායි ආහාර සහ බීමට ගන්නා පිරිසිදු ජලය ප්‍රමාණවත් ලෙස සැළසීමෙන් රෝග සහ මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීම;

(ඇ) මව්වරුන් සඳහා උචිත පූර්ව-ප්‍රසව ආරක්ෂාව සහතික කිරීම;

(ඉ) සමාජයේ සියලු කොටස්වලට විශේෂයෙන්ම දෙමාපියන්ට සහ ළමයින්ට, ළමා සෞඛ්‍යය සහ පෝෂණය, මව්කිරි දීමේ වාසි, ස්වස්ථතාව හා පාරිසරික සනීපාරක්ෂාව සහ අනතුරු වැළැක්වීම පිළිබඳව මූලික දැනුමක් සලසනු ලබන බව සහතික කිරීම;

(ඊ) නිවාරක සෞඛ්‍යය ආරක්ෂක සේවා වර්ධනය කිරීම, දෙමාපියන්ට මඟ පෙන්වීම සහ පවුල් සැලසුම් අධ්‍යාපනය සහ සේවාවන් සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතු ය.

(3) ශාරීරික හෝ මානසික සෞඛ්‍යය සඳහා ආරක්ෂාව සැළසීමේ හෝ ප්‍රතිකාර ගැනීමේ කාර්යය සඳහා යම් ආයතනයක තබන ලද ළමයෙකුට රැකවරණයට, ආරක්ෂාවට ඇති අයිතිය සහ ඒ ළමයාට සලසන ලද ප්‍රතිකාර සහ ඒ ළමයා වෙනුවෙන් සලසන ලද වෙනත් පහසුකම් කලින් කල සමාලෝචනය කිරීමක් සඳහා ඇති අයිතිය රජය විසින් පිළිගත යුතු ය.

(4) මේ ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබූ අයිතිය ක්‍රම ක්‍රමයෙන් සම්පූර්ණයෙන් අත් පත් කර ගැනීමේ අරමුණ ඇතිව රජය විසින් ජාත්‍යන්තර සහයෝගතාව ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම කළ යුතු ය.

## 26 වන ව්‍යවස්ථාව

### සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග

සලසනු ලැබ ඇත්තාවූ යම් සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ගවලින් ප්‍රතිලාභ ලැබීමට සෑම ළමයෙකුටම ඇති අයිතිය රජය විසින් පිළිගත යුතු අතර, මේ අයිතිය සම්පූර්ණයෙන් මුදුන් පත්කර ගැනීම සහතික කළ යුතු ය.

## 27 වන ව්‍යවස්ථාව

### ජීවන තත්ත්වය

(1) ළමයාගේ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක සහ සමාජ සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට සෑම ළමයෙකුටම ඇති අයිතිය රජය විසින් පිළිගත යුතු ය.

(2) ළමයාගේ සංවර්ධනය සඳහා අවශ්‍ය ජීවන තත්ත්වය තම හැකියාවන් සහ මූල්‍ය ශක්තිය ඇතුළත අත්කරදීම ඒ ළමයාගේ දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ මූලික වගකීම වන්නේ ය.

(3) රාජ්‍ය ප්‍රතිපත්තියේ විධානාත්මක සිද්ධාන්තවලට අනුකූලය මේ අයිතිය ක්‍රියාත්මක කිරීමට දෙමාපියන්ට සහ භාරකරුවන්ට සහායවීමට රජය විසින් උචිත ක්‍රියාමාර්ග ගත යුතු අතර විශේෂයෙන්ම පෝෂණය, ඇඳුම් සහ නිවාස සම්බන්ධයෙන්, අවශ්‍යතාව ඇති වුවහොත්, ද්‍රව්‍යමය සහාය සහ ආධාර සැළසිය යුතු ය.

(4) රට ඇතුළත හෝ ඉන් පිටත වාසය කරන දෙමාපියන්ගෙන් ළමයා වෙනුවෙන් නඩත්තු අය කර ගැනීම සුරක්ෂිත කිරීමට රජය විසින් සියලු උචිත පියවර ගත යුතු ය. මේ කාර්යය අත්කර ගැනීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට සමායෝගවීම හෝ එවැනි ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම මෙන්ම වෙනත් උචිත වැඩ සංවිධාන ඇති කර ගැනීම රජය විසින් ප්‍රවර්ධනය කළ යුතු ය.

## 28 වන ව්‍යවස්ථාව

**අධ්‍යාපනය**

(1) නුගත්කම සහමුලින් උපුටා දැමීමේ අරමුණ ඇතිව සහ අධ්‍යාපනයට සර්ව සාධාරණ වූ සහ සමාන වූ ප්‍රවේශයට ඇති අයිතිය සියලු තැනැත්තන්ට සහතික කිරීම පිණිස වයස අවුරුදු හයේ සිට දහසය දක්වා වූ ළමයින්ට රජය විසින් අනිවාර්යය අධ්‍යාපනය සැලසිය යුතු ය.

(2) (1) වන ඡේදයෙහි සඳහන් පරමාර්ථ අත්කර ගැනීමේ අරමුණ ඇතිව -

(අ) නිදහස් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා විධිවිධාන සැළැස්වීම සහ මේ ප්‍රතිලාභය සඳහා සෑම ළමයෙකුටම ප්‍රවේශය සහතික කිරීම;

(ආ) සාමාන්‍ය සහ වෘත්තිය අධ්‍යාපනය ඇතුළු ව විවිධ ද්විතිය අධ්‍යාපනය ක්‍රම වර්ධනය කිරීමට දිරිගැන්වීම සහ සෑම ළමයෙකුටම ඒවා ලබා ගැනීමට සහ ප්‍රවේශවීමට සැළැස්වීම, තවද, නිදහස් අධ්‍යාපනය හඳුන්වාදීම වැනි උචිත ක්‍රියාමාර්ග ගැනීම සහ අවශ්‍යතා ඇති වුවහොත් මුදලින් ආධාර සැලසීම;

(ඇ) උසස් අධ්‍යාපනය සඳහා විධිවිධාන සැලසීම සහ දක්ෂතාවයෙහි පදනම මත සියලු තැනැත්තන්ට ප්‍රවේශය ලබා ගැනීමට සැළසීම;

(ඈ) සෑම ළමයෙකුටම ලබා ගත හැකි සහ ප්‍රවේශය ලැබිය හැකි අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන තොරතුරු ලබා ගැනීමට සැළැස්වීම;

(ඉ) පාසල්වල නොකඩවා පැමිණීම දිරිගැන්වීමට සහ ඉගෙනීම අතහැර යන්නන්ගේ අනුප්‍රමාණය අඩුකිරීමට උචිත ක්‍රියාමාර්ග ගැනීම සඳහා රජය විසින් සෑම ප්‍රයත්නයක්ම ගත යුතු ය.

(3) ළමයාගේ ගරුත්වයට ගැලපෙන අයුරින් සහ මේ ප්‍රඥප්තියට

අනුකූල ආකාරයකින් ප්‍රජාවගේ යහපත සඳහා පාසල්වල විනය දැඩි ලෙස පරිපාලනය කරනු ලබන බව සහතික කිරීමට ද විශේෂයෙන්ම -

(අ) ජීවිතය සම්බන්ධයෙන් ආගමික, සමාජ සහ සංස්කෘතික අගැයීම් පිළිබඳ ව නිසි මඟපෙන්වීම ගුරුවරුන් විසින් ළමයින්ට සලසන බව සහතික කිරීම;

(ආ) එක් එක් තැනැත්තාගේ හැඟීම්වලට සහ අදහස්වලට ගෞරවය දක්වමින් සාමකාමී පරිසරයක ළමයින් වර්ධනය වීම සහතික කිරීම;

(ඇ) ජීවන මාර්ගයක් වශයෙන් ආගමෙහි පරම වැදගත්කම පිළිගැනීමට ගුරුවරයා බැඳී සිටීම සඳහා රජය විසින් උචිත සියලු ක්‍රියාමාර්ග ගත යුතු ය.

(4) රට මුළුල්ලේම නූගත්කම සහ අකුරු නොදැන්ම තුරන් කිරීමට දායකවීමේ සහ විද්‍යාත්මක තාක්ෂණ ඥානය සහ නූතන ඉගැන්වීමේ ක්‍රම සඳහා ප්‍රවේශය ලබා ගැනීමට පහසුකම් සැළසීමේ අරමුණ ඇතිව, විශේෂයෙන්ම, අධ්‍යාපනයට අදාළ කාරණා පිළිබඳව රජය විසින් ජාත්‍යන්තර සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සහ දිරි ගැන්වීම කළ යුතු ය.

**29 වන ව්‍යවස්ථාව**
**අධ්‍යාපනයේ අරමුණු**

(1) රජය විසින් ළමයෙකුට සලසනු ලබන අධ්‍යාපනය -

(අ) ළමයෙකුගේ පුද්ගල විශේෂතාව, දක්ෂතා, මානසික සහ ශාරීරික හැකියාවන් ඔහුගේ උපරිම විභවයන් අනුව වර්ධනය කිරීම;

(ආ) මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ් වී ඇති සිද්ධාන්ත කෙරෙහි ගෞරවය වර්ධනය කිරීම;

(ඇ) තම දෙමාපියන් තමාගේම සංස්කෘතික අනන්‍යතාව, භාෂාව සහ ඇගයීම්, රටේ ජාතික අගැයීම් සහ තමාගේ ශිෂ්ටාචාරයට වෙනස් ශිෂ්ටාචාර පිළිබඳ ගෞරවය වර්ධනය කිරීම;

(ඈ) විවිධ ගෝත්‍රික, ජාතික සහ ආගමික කණ්ඩායම්වලට අයත් සියලු ජනයා සහ දේශීය ප්‍රභවයන් ඇති තැනැත්තන් අතර අවබෝධය, සාමය, ඉවසීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ මිත්‍රත්වය පිළිබඳ හැඟීමක් ඇතිව, නිදහස් සමාජයක වගකිව යුතු ජීවිතයක් සඳහා ළමයා පිළියෙළ කිරීම;

(ඉ) ස්වභාවික පරිසරය සඳහා ගෞරවය වර්ධනය කිරීම;

උදෙසා යොමු කළ යුතු ය.

(2) මේ ව්‍යවස්ථාවේ සහ 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධ්‍යාපන ආයතන පිහිටුවීමට සහ ඒවා මෙහෙයවීමට පුද්ගලයන්ගේ සහ මණ්ඩලවල නිදහස කෙරෙහි මැදිහත්වන්නේයයි තේරුම් නොගත යුතු ය. එසේ වුව ද, (1) වන ඡේදයේහි දක්වා ඇති විධිවිධාන පිළිපදිනු බවට සහ ඒ ආයතනවලින් දෙනු ලබන අධ්‍යාපනය රජය විසින් නියම කරනු ලබන අවම ප්‍රමිතිවලට අනුකූල විය යුතු බවට වූ නියමයන්ට යටත් විය යුතු ය.

## 30 වන ව්‍යවස්ථාව

### සුළු ජන කොටස්වලට අයත් ළමයින්

සුළු ජන කොටසකට අයත් ළමයෙකුට දේශීය ළමයෙකුට ඔහුගේ ම සංස්කෘතිය භුක්ති විඳීමට ඔහුගේ ම ආගම ඇදහීමට සහ පිළිපැදීමට හෝ තම ජන කොටසට අයත් වෙනත් තැනැත්තන් සමග එක්ව තමාගේ භාෂාව පාවිච්චි කිරීමට ඇති අයිතිය අහිමි නොකළ යුතු ය.

## 31 වන ව්‍යවස්ථාව

**විවේක කාලය, විනෝදාත්මක සහ සංස්කෘතික කටයුතු**

(අ) වයසට උචිත ක්‍රීඩා සහ විනෝදාත්මක කටයුතුවල නිරතවීමට සහ සංස්කෘතික ජීවිතයෙහි සහ කලාශිල්පවල නිදහස් ලෙස සහභාගිවීමට ළමයාට විවේක කාලය තිබීමේ අයිතිය රජය විසින් පිළිගත යුතු ය. තවද

(ආ) සංස්කෘතික සහ කලාත්මක ජීවිතයෙහි සහභාගිවීමට ළමයාගේ අයිතිය රජය විසින් ගරු කළ යුතු අතර, එය ප්‍රවර්ධනය කළ යුතුය. තවද, සංස්කෘතික, කලාත්මක, විනෝදාත්මක සහ විවේක කාලයේ වැඩ කටයුතු සඳහා උචිත සහ සමාන අවස්ථා සැළසිය යුතු ය.

## 32 වන ව්‍යවස්ථාව

**ළමයා ශ්‍රමයෙන් ආරක්‍ෂා කිරීම**

(1) ආර්ථික වශයෙන් සූරාකෑමෙන් සහ අවදානම් වැඩ කිරීමෙන් රජය විසින් ළමයා ආරක්‍ෂා කළ යුතු ය. තවද, ළමයාගේ සෞඛ්‍යයට හෝ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හෝ සමාජ සංවර්ධනයට හානිකරවන යම් ක්‍රියාවකින් ආරක්‍ෂා කළ යුතු ය.

(2) මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස රජය විසින් උචිත ව්‍යවස්ථාමය, පරිපාලන, සමාජ සහ අධ්‍යාපන ක්‍රියාමාර්ග ගත යුතු ය. තවද විශේෂයෙන්ම -

(අ) විවිධ වර්ගවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් ඒකාකාර අවම වයසක් සඳහා;

(ආ) සේවා කොන්දේසි සහ වැඩකරන කාලය සඳහා;

(ඇ) මේ ව්‍යවස්ථාව ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස දණ්ඩන හෝ වෙනත් තහංචි සඳහා විධිවිධාන සැළැස්විය යුතු ය.

## 33 වන ව්‍යවස්ථාව

## මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිත කිරීම සහ ජාවාරම් කිරීම

රජය විසින් -

(අ) මත්ද්‍රව්‍යවලින් සහ මනස විකෘති කරන ද්‍රව්‍යවලින් ළමයින් ආරක්ෂා කිරීමට;

(ආ) ඒ ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිපදවීමෙහි ලා සහ ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ජාවාරම් කිරීමෙහිලා ළමයින් යෙදවීම වැළැක්වීමට;

(ඇ) මද්‍යසාරය, දුම්කොළ සහ දුම්කොළ නිෂ්පාදනවලින් ළමයින් ඈත් කිරීමට ව්‍යවස්ථාමය, පරිපාලන, සමාජ සහ අධ්‍යාපන ක්‍රියාමාර්ග ඇතුළු සියලු උචිත ක්‍රියාමාර්ග ගත යුතු ය.

## 34 වන ව්‍යවස්ථාව

## ලිංගික වශයෙන් අයුතු ලෙස යෙදවීමෙන් ආරක්ෂා කිරීම

සියලු ආකාරයෙන් ලිංගික වශයෙන් සූරාකෑමෙන් සහ ලිංගික වශයෙන් අයථා ප්‍රයෝජන ගැනීමෙන් සහ විශේෂයෙන්ම -

(අ) යම් නීති විරෝධී ලිංගික කටයුත්තක යෙදවීමට ළමයෙකු පෙළඹවීම හෝ ඔහුට බලකිරීම;

(ආ) ළමයින් වෛශ්‍යා කර්මයෙහි හෝ වෙනත් නීති විරෝධී ලිංගික පරිචයන්හි අයුතු ලෙස යෙදවීම;

(ඇ) අසභ්‍ය රඟපෑම් සහ ද්‍රව්‍යවලින් ළමයින් සූරාකෑමෙන් යෙදවීම වැළැක්වීමට රජය විසින් ක්‍රියාමාර්ග ගත යුතු ය.

## 35 වන ව්‍යවස්ථාව

## විකිණීමෙන් සහ පැහැරගෙන යාමෙන් ආරක්ෂා කිරීම

කවර හෝ ආකාරයකින් වූ කාර්යයක් සඳහා ළමයින් පැහැරගෙන යාම හෝ විකිණීම වැළැක්වීම පිණිස රජය විසින් ජාතික ද්විපාක්ෂික, බහුපාක්ෂික උචිත සියලු ක්‍රියාමාර්ග ගත යුතු ය.

## 36 වන ව්‍යවස්ථාව

## වධ හිංසාවලින් සහ නිදහස අහිමි කිරීමෙන් ආරක්‍ෂා කිරීම

(අ) ළමයකු වධ හිංසාවලට හෝ වෙනත් කෲර අමානුෂික හෝ පහත් කොට සැලකිමකට යටත් නොකරන බව රජය විසින් සහතික කළ යුතු ය. ඒ ළමයා විසින් සිදු කරන ලද වැරදි සඳහා මුදා ගැනීමේ හැකියාවක් නොමැතිව මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාර ගත කරනු ලැබීම හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(ආ) ළමයෙකුට නීති විරෝධී ලෙස හෝ අත්තනෝමතික ලෙස ඔහුගේ නිදහස අහිමි නොකරන බව රජය විසින් සහතික කළ යුතු ය. නීතියෙන් ස්ථාපිත කාර්ය පටිපාටියට අනුකූල වන්නේ නම් මිස, ළමයෙකු සිරභාරයට ගැනීම හෝ රඳවා ගනු ලැබීම නොකළ යුතු ය.

(ඇ) නිදහස අහිමි කරනු ලැබූ ළමයෙකුට -

(i) මානුෂිකව සහ මනුෂ්‍යයකු සතු නෛසර්ගික ගරුත්වය පිළිබඳ ගෞරවය ඇතිව සළකනු ලැබිය යුතු ය. ළමයාගේ උපරිම යහපත තත්කාර්යය නොකිරීම සඳහා සළකනු ලබන්නේ නම් මිස, නිදහස අහිමි කරනු ලැබූ සෑම ළමයෙකුම වැඩිහිටියන්ගෙන් වෙන්කළ යුතු ය. තවද විශේෂතම අවස්ථාවල දී හැර ලිපි කටයුතු සහ පැමිණීම් මගින් තම පවුල සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට ඔහුට/ඇයට අයිතිය ඇත්තේ ය.

(ii) නීත්‍යානුකූල ප්‍රවේශයට සහ වෙනත් උචිත සහාය ලැබීමට අයිතිය ඇත්තේ ය. තවද, තම නිදහස අහිමි කිරීමේ නීත්‍යානුකූලභාවය අධිකරණයක් ඉදිරියෙහි අභියෝග කිරීමේ අයිතිය සහ එවැනි යම් නඩුවක් සම්බන්ධයෙන් නොපමාව තීරණයක් ලැබීමේ අයිතිය ඇත්තේ ය.

## 37 වන ව්‍යවස්ථාව

## සන්නද්ධ ගැටුම්වලින් ආරක්‍ෂාව

රජය විසින් -

(අ) සටන්වල දී ළමයෙකු කෙලින්ම සහභාගි නොවන බව සහතික කිරීමට සියලු යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය;

(ආ) ළමයකු සන්නද්ධ හමුදාවලට බඳවා ගැනීමෙන් වැළකිය යුතු ය;

(ඇ) සන්නද්ධ ගැටීමකින් පීඩාවට පත් ළමයින් වෙනුවෙන් ආරක්ෂාව සහ රැකවරණය සහතික කිරීම පිණිස සියලු යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

**38 වන ව්‍යවස්ථාව**

**පුනරුත්ථාපන රැකවරණය**

කවර වූ යම් ආකාරයක නොසැලකිලිමත්භාවයකට, සූරාකෑමකට, අයථා ක්‍රියාවකට, වධ හිංසාවකට හෝ වෙනත් යම් ආකාරයක කෲර අමානුෂික හෝ පහත් කොට සලකන දඬුවමකට පාත්‍ර වූ ළමයෙකු ශාරීරික සහ මානසික වශයෙන් නැවත සුවපත් කිරීම සහ සමාජ වශයෙන් ප්‍රතිසංකලනය කිරීම ප්‍රවර්ධනය කිරීමෙහිලා උචිත ක්‍රියාමාර්ග ගැනීමට රජය බැඳී ඇත්තේ ය. එවැනි නැවත සුවපත් කිරීමක් සහ ප්‍රතිසංකලනය කිරීමක් ළමයාගේ සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා පහසුකම් සලසවන්නා වූ සහ ළමයාගේ ආත්ම ගෞරවය සහ ගරුත්වය පෝෂණය කරන්නා වූ පරිසරයක සිදුවිය යුතු ය.

**39 වන ව්‍යවස්ථාව**

**බාලක යුක්තිය පසිඳලීම**

(1) මානව අයිතිවාසිකම්, ළමයාගේ වයස සහ ළමයාගේ ප්‍රතිසංකලනය උසස් කොට සමාජයෙහි නිර්මාණාත්මක කාර්ය භාරයක් භාර ගැනීමේ යෝග්‍යතාව සඳහා ළමයාගේ ගෞරවය ප්‍රතිසාධනය කරන්නා වූ අභිමානය සහ වටිනාකම පිළිබඳ ව ළමයාගේ හැඟීම ප්‍රවර්ධනය කිරීමට අනුකූල වන ආකාරයකින් සලකනු ලැබීමට නීතිය උල්ලංඝනය කරනු ලැබුවේයයි කියනු ලබන්නා වූ හෝ එලෙස චෝදනා කරනු ලබන්නා වූ සෑම ළමයකුගේ ම අයිතිය රජය විසින් පිළිගත යුතු ය.

(2) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ් වී ඇති පරිදි, තමා වරදකරුයයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තකුම අහිංසකයයි පූර්ව නිගමනය කළ යුතු ය.

(3) නීතිය උල්ලංඝනය කරනු ලැබුවේයැයි කියනු ලබන්නා වූ හෝ එලෙස චෝදනා කරනු ලබන්නා වූ සෑම ළමයකුටම -

(අ) ඔහුට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන් නොපමාව සහ කෙළින්ම ද, උචිත වන්නේ නම් ඔහුගේ දෙමාපියන් හෝ භාරකරුවන් මගින් දන්වනු ලැබීම සහ තම විත්තිවාචකය සකස් කර ගැනීමෙහිලා සහ ඉදිරිපත් කිරීමෙහිලා නෛතික හෝ වෙනත් උචිත සහාය ලබා ගැනීම;

(ආ) නිසි අධිකරණයක් මගින් නීතිය අනුව සාධාරණ නඩු විභාගයක දී ප්‍රමාදයකින් තොරව, කාරණය තීරණය කරවා ගැනීම;

(ඇ) තමා වෙනුවෙන් සාක්ෂි දීමට හෝ වරදකරු බවට අපරාධෝච්චාරණයක් කිරීමට, සාක්ෂිකරුවන් විභාග කිරීමට සහ තමා වෙනුවෙන් සාක්ෂිකරුවන්ගේ සහභාගිත්වය සහ ඔවුන් විභාග කිරීම බලකරනු නොලැබීම සහතික කළ යුතු ය.

(4) රජය විසින්

(අ) අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය කළ යුතු ය;

(ආ) නීතිය උල්ලංඝනය කරනු ලැබීම සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ නැතහොත් වරදකරු කරනු ලැබූ ළමයින්ට විශේෂයෙන් අදාළ විය යුතු අධිකරණයන් සහ ආයතන පිහිටුවිය යුතු ය.

(5) නීතිය උල්ලංඝනය කිරීමට නොහැකි ළමයෙකුගේ අවම වයස් ප්‍රමාණය රජය විසින් තීරණය කළ යුතු ය.

(6) මානව අයිතිවාසිකම් සහ නෛතික ආරක්ෂාවන් කෙරෙහි නිසි සැළකිල්ල ඇතිව, අධිකරණ කටයුතු උපයෝගි කිරීමෙන් තොරව, හැකි කවර හෝ විටෙක ඒ ළමයින් පිළිබඳ ව කටයුතු කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග ගත යුතු ය.

(7) නීතිය උල්ලංඝනය කිරීම සඳහා චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ ළමයෙකු ආයතනගත කිරීම හැකිතාක් ප්‍රමාණයට වළක්වනු පිණිස නමයතාව සඳහා ඉඩදීමෙන් රජය විසින් අධිකාරීන්ට සුදුසු ලෙස ක්‍රියාකිරීම සම්බන්ධයෙන් විවිධතාවක් ලබාදිය යුතු ය.

(8) නීතිය උල්ලංඝනය කරනු ලැබීම සඳහා චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ ළමයෙකුට රැකවරණය, මඟ පෙන්වීම, උපදෙස් දීම, අධ්‍යාපන සහ වෘත්තීය පුහුණුව ලබාගත හැකි බව රජය විසින් සහතික කළ යුතු ය.

## 40 වන ව්‍යවස්ථාව

## කමිටු පිහිටුවීම

(1) ප්‍රඥප්තිය සමීක්ෂණය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(අ) ජනාධිපතිවරයා විසින් පත්කරල ලද තැනැත්තන් හය දෙනෙක්;

(ආ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඇ) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඈ) රාජ්‍ය ආරක්ෂාව විෂයය භාර අමාත්‍යවරයාගේ අමාංත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඉ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඊ) වනිතා කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(උ) සමාජ ගෘහසාධනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඌ) ප්‍රතිපත්ති සැළසුම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(එ) කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඒ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඔ) පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස්වරයා.

(2) ජනාධිපතිවරයා විසින් කමිටුවේ සභාපතිවරයා පත් කළ යුතු ය.

(3) (අ) කමිටුව වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳ ව උපදෙස් ඉදිරිපත් කිරීම

(ආ) ප්‍රඥප්තියේ විධිවිධාන සම්බන්ධයෙන් අවබෝධයක් ඇති කිරීම;

(ඇ) ප්‍රඥප්තියේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඈ) ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමීක්ෂණය කිරීම කමිටුවේ කර්තව්‍යය වන්නේ ය.

(උ) සමාජ ශුභසාධනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඌ) ප්‍රතිපත්ති සැළසුම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(එ) කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඒ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(ඔ) පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස්වරයා.

(2) ජනාධිපතිවරයා විසින් කමිටුවේ සභාපතිවරයා පත් කළ යුතු ය.

(3) (අ) කමිටුව වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳ ව උපදෙස් ඉදිරිපත් කිරීම

(ආ) ප්‍රඥප්තියේ විධිවිධාන සම්බන්ධයෙන් අවබෝධයක් ඇති කිරීම;

(ඇ) ප්‍රඥප්තියේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඈ) ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමීක්ෂණය කිරීම කමිටුවේ කර්තව්‍යය වන්නේ ය.